ගරු පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.
2021 - 09 - 06

ගරු පොලිස්පතිතුමනි,

<u>අපරාධයක් පිලිබඳව පරීක්ෂණ පැවැත්වීමේ මුවාවෙන්, පුරවැසියන් බිය ගැන්වීමට සැලැස්වීම හා කරදරයට පත් කිරීම සඳහා, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය තුළ අන්තර්ගත ප්‍රතිපාදන අවභාවිතා කිරීම:</u>

මෑත භාගයේදී මාධ්‍ය මගින් වාර්තා කරනු ලැබ ඇති, සිද්ධි ගනනාවක් මගින් මෙන්ම රටේ පුරවැසියන් විසින්, මහජන මන්ත්‍රී වරයකු ලෙස මා හට දන්වා ඇති පරිදි, ඉහත කී අකටයුත්ත මෙරට පුරවැසියන්ට සිදුවන බව මම නිරීක්ෂණය කොට සිටිමි.

ඔබ විසින් හොඳින් දන්නා පරිදි මෙරටේ පුරවැසියන් ගනනාවකට, ඔවුන් විසින් සිදු කරන ලද ප්‍රකාශයන් පදනම් කොට ගෙන හෝ සිදු කරන ලද දුරකතන සංවාදයන් පදනම් කොට ගෙන, යම් අපරාධමය කරුණක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන පරීක්ෂණයකට සහාය ලබා ගැනීම සඳහා, එම දෙපාර්තමේන්තුවට පැමිනෙන්නයි දන්වා එවා ඇත.

මෙම සියලු පුරවැසියන් මෙරටේ නීති ගරුක පුරවැසියන් වන අතර, රටේ නීතිය හා විධානය පවත්වාගෙන යාමට උපරිමව කැපවූ පුද්ගලයන් වන්නේය.

පොලිස් දෙපාර්තමේන්තුව විසින් අපරාධයක් පිලිබඳව පරීක්ෂණ පැවැත්වීමේ මුවාවෙන්, පුරවැසියන් බියගැන්වීමට සැලැස්වීම හා කරදරයට පත් කිරීම සඳහා, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය තුළ අන්තර්ගත ප්‍රතිපාදන අවභාවිතා කිරීමේ අවධානමක් පවතින හෙයින්, ඒ පිලිබඳව පහත කරුණු ඔබගේ අවධානයට ලක් කරමි.

ඔබතුමන් හොඳින් දන්නා පරිදි අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 109(6) යටතේ මෙවැනි පරීක්ෂණයක් සඳහා මෙරට පුරවැසියන්ගෙන් සහාය ලබා ගැනීමේ බලතල, පොලිසිය සතුවන්නේය. එනමුදු එවැනි පරීක්ෂණයක් ඇරඹීමට ප්‍රාථමික වන්නේ පොලීසියට වාර්තා වන වරද පදනම් වන තොරතුරයි.

අවාසනාවකට පොලීසිය විසින් ඉහත 109(6) වගන්තිය යටතේ පුද්ගලයකු දැනට පොලීසියට කැඳවනු ලැබ ඇති කිසිදු සන්නිවේදනයක් තුළ, අදාල පුද්ගලයා කැඳවන්නේ කුමන වරදක් සම්බන්ධයෙන් සැක කිරිමට ලක්ව ඇති පරීක්ෂණයකට දැයි දන්වා සිටීමට අපොහොසත්ව තිබේ.

යමෙක් පොලීසියට කැඳවන්නේ, තමන් සහභාගීවන අපරාධමය ස්වරූපයක් ගන්නා පරීක්ෂණයට පදනම් වන අපරාධය කුමක්දැයි නොදැන නම්, සහ පොලිසිය විසින් එම අපරාධයේ පදනම තමන් කැඳවන සාක්ෂිකරු ගෙන් සඟවන්නේ නම්, ඒ තුළ අදාල පුද්ගලයාගේ අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවන බව කිව යුතුව තිබේ.

එනම් එම පුද්ගලයා සතු නෛසර්ගික අයිතියක් වන ස්වභාවික යුක්තියේ මූලධර්මයන්ගේ ආරක්ෂාව ඔහුට හෝ ඇයට නැති කර දමන බව මෙහිලා සිහිපත් කරන්නට කැමැත්තෙමි.

මෙම වගකීම අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 109(5) වගන්තිය යටතේ පොලීසියේ අපරාධ පරීක්ෂකයකුට නිසි ලෙස ආරෝපනය කොට ඇති වගකීමක් බව සිහිපත් කරමි.

එසේම මෙම වගකීම අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ 13 ව්‍යවස්ථාවේ අන්තර්ගත පුරවැසියකු සතු මූලික අයිතිවාසිකමක් ලෙසටද පිළිගෙන ඇති වගකීමක් බවද සිහිපත් කරන්නට කැමැත්තෙමි. එම අයිතිය උල්ලංඝනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වගන්තිය යටතේ, මානව හිමිකම් නඩුවක් පැවරීමට තුඩුදෙන වරදක් බවද මෙහිලා සඳහන් කරන්නට කැමැත්තෙමි.

වරදක් පිලිබඳව පරීක්ෂණ කිරීමේදී සංඥේය වරදක් පිලිබඳව පරීක්ෂණ කිරීම සඳහා, නිසඟ බලයක් පොලීසියට හිමිවන නමුත් සංඥේය නොවන වරදක් පිලිබඳව පරීක්ණ පැවැත්වීමක් සිදු කරන්නේ නම්, ඒ සඳහා අනිවාර්යෙන්ම අදාළ පොලිස් බලප්‍රදේශයට අදාළ වන්නාවූ මහේස්ත්‍රාත්වරයාට තොරතුරු වාර්තා කොට, පරීක්ෂණ කටයුතු කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයා වෙතින් බලය ලබා ගතයුතු බවට, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 118 වන වගන්තිය මගින් සලසා ඇති ප්‍රතිපාදනය වෙත ඔබගේ අවධානය මෙයින් යොමු කරන්නෙමි.

ඉහත දෙආකාරයේම ප්‍රතිපාදයන් මගින් පෙන්නුම් කරන්නේ, පරීක්ෂණයට කැඳවන සාක්ෂිකරුවකු, තමන් මුහුණ දෙන පරීක්ෂණයේ පදනම දැනගැනීමේ වැදගත්කමයි. නමුත් ඔබ දෙපාර්තමේන්තුව එම අවශ්‍යතාවය නොතකා, පරීක්ෂණ වලට මෙරට පුරවැසියන් කැඳවමින් සිටීම, නීතිය අවභාවිතා කිරීමක් වන්නේය.

අනෙක් අතට ඔබ දෙපාර්තමේන්තුව, පරීක්ෂණයක් සඳහා පුරවැසියන් කැඳවන්නේ, සංඥේය නොවන වරදකට අදාල පරීක්ෂණයකට නම් එවැනි පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස් දෙපාර්තමේන්තුවට බලයක් නැති බව කියා සිටිමි. ගරු මහේස්ත්‍රාත්වරයකුට කරුනු වාර්තා නොකොට, ගරු මහේස්ත්‍රාත්වරයකුගෙන් අවසර ලබා නොගෙන, සිදුකරන එවැනි පරීක්ෂණයක්, පැහැදිලි ලෙස නීති විරෝධී පරීක්ෂණයක් වන බව ඔබට සිහිපත් කොට සිටින්නෙමි.

එසේම ඔබට බලය ලැබෙන්නේ, වාර්තා වූ වරදක් පිලිබඳව පරීක්ෂණය කිරීමට මිස, පුරවැසියකු විසින් සිදු කරන ලද මතයක් හෝ අදහස් ප්‍රකාශ කිරීමක් පිලිබඳව පරීක්ෂණ පැවැත්වීමට නොවන බව සඳහන් කරන්නට කැමැත්තෙමි. යම් හෙයකින් පොලිස් දෙපාර්තමේන්තුව, පුද්ගලයන් විසින් සිදු කරන ඕනෑම ප්‍රකාශයක් පිලිබඳව පරීක්ෂණ පවත්වන්නට යොමුවන්නේ නම්, එමගින් මෙරට තුළ පවත්වාගෙන යන නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයට ඉමහත් තර්ජනයක් ඇති කරන්නට හේතු වනු නියත බව ඔබට සිහිපත් කොට සිටින්නෙමි. එවැන්නක් මෙරට පවතින නීතියේ අධිකාරිය යටපත් කිරීමක්ද වන්නේය.

එසේම එවැනි ක්‍රියාවක් නිසැකවම අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ 14(1) (අ) ව්‍යවස්ථාවේ අන්තර්ගත, පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ සහ භාෂණයේ නිදහස, උල්ලංඝනය කිරීමක් වන්නේය.
එසේම අදහස් ප්‍රකාශනය හා භාෂණයේ නිදහස මෙරට තුළ ICCPR පනත ක්‍රියාත්මක වීමත් සමග පුලුල්වී ඇති බව සිහිපත් කර සිටිමි.

ඒ යටතේ, සෑම පුද්ගලයකුටම බලපෑමකින් තොරව මතයක් දැරීමට අයිතියක් ඇති බව, දැන් අප රට තුළ පිළිගත් අයිතියකි. එසේම සෑම පුද්ගලයකුටම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් පවතින අතර, එම අයිතිය දේශ සීමා හා මායිම් තුළ නොපිහිටා, තොරතුරු හා අදහස් සොයා යෑම, ලබා ගැනීමේ හා බෙදාහැරීමේ නිදහස හා තම අදහස් වාචිකව, ලිඛිතව , මුද්‍රිතව, ඕනෑම ආකාරයක කලාත්මක ප්‍රකාශයක් හෝ වෙනත් මාධ්‍යයක් තුලින් ප්‍රකාශ කිරීමට හැකි බව පිළිගෙන තිබේ.

ඔබ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, මතයක් පල කල පුද්ගලයකු පරීක්ෂණයකට කැඳවා, අරමුණු කරන්නේ එම මතය දැරූ පුද්ගලයා පමණක් නොව, මුලු මහත් සමාජයම අදහස් ප්‍රකාශ කිරීමෙන් වැලක්වීම සඳහා, යම් බියක් හෝ කරදරයක් ජනිත කරලීම නම්, එය මෙරට පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් උදුරා ගැනීමකි. එම නිසා මෙම ක්ෂේත්‍රය තුළ ක්‍රියා කිරීමේදී, තමන් සතු බල පරාසයන් නොඉක්මවා කටයුතු කිරීමේ වැදගත් කම මෙහිලා සිහිපත් කරමි.

ඔබ සතු බල පරාසය, රටේ නීතිය මගින් නිශ්චය කොට තිබේ. යම් හෙයකින් ඔබගේ දෙපාර්තමේන්තුව මෙරට පුරවැසියකු විසින් සිදුකරන ලද, යම් ප්‍රකාශයක් පිලිබඳව පරීක්ෂණයක් ආරම්භ කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ 15(2) වගන්තිය යටතේ හෝ 15(7) වගන්තිය යටතේ හෝ දැනට මෙරට නීතියක් ලෙස බලපවත්වන ICCPR පනත යටතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ දැක්වෙන වරදක් ස්ථාපනය කොට ඇති බවට විශ්වාස කරන්නේ නම්, පළමුව සිදු කල යුතුව ඇත්තේ, අප ඉහතින් සඳහන් කළ පරිදි, එම පුද්ගලයා විසින් යම් වරදක් සිදු කොට ඇති බවට හෝ එවැනි වරදක් සිදු කිරීමට ආධාර අනුබල දී ඇති බව, අදාළ පුද්ගලයාට දැනුම් දීමයි. එසේත් නැති නම් ඒ බව මහේස්ත්‍රාත් වරයකුට කරුණු වාර්තා කොට, පරීක්ෂණ පැවැත්වීම සඳහා අවසර ලබා ගැනීමයි.එසේ නොකොට පුද්ගලයන් පරීක්ෂණ සඳහා පොලීසිය ඉදිරියට කැඳවීමට ඔබ දෙපාර්තමේන්තුව සතුව බලයක් නොමැති බව මෙහිලා අවධාරණය කොට සිටිමි.

තවද එවැනි අනීතික ක්‍රියා මගින් මෙරට පුරවැසියන් බියගැන්වීමට හෝ කරදරයට පත් කිරීමට මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට ප්‍රතිඥා ලබා දී ඇති රාජ්‍ය සේවකයන් ලෙස ඔබට කිසිදු අයිතියක් හෝ බලයක් නොමැති බව කියා සිටිමි. මෙම අනීතික ක්‍රියා මෙලෙසට තවදුරටත් ඉදිරියට ගෙන යන්නේ නම් ඔබ සහ ඔබගේ දෙපාර්තමේන්තුවේ, අදාළ නීති විරෝධී ක්‍රියාවන්හි නිරත නිලධාරීන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩු පවරන්නට සිදුවන බව කාරුණිකව දන්වා සිටිමි.

මෙයට,
පාඨලී චම්පික රණවක ( පා.ම)